ගොවි කටයුතු අධ්‍යයන 2 (1)' 1985, 13—25 

# ශ්‍රී ලංකාවේ අර්තාපල් වගාව—අලෙවිකරණ රටාව පිළිබඳ විග්‍රහයක්

බණ්ඩාර රත්නායක

## හැඳින්වීම

ලෝකයේ ප්‍රෞඪ ශිෂ්ටාචාරයක් ගොඩනැගූ මායා සහ ඉන්කා ජාතීන් විසින් දකුණු ඇමරිකාවේ අන්දීස් කඳුවැටිය නිජභූමිය කොට ගත් අර්තාපල් (Potatoes) ආහාර ද්‍රව්‍යයක් වශයෙන් හඳුනාගෙන, දහසය වැනි සියවසේදී යුරෝපාකරයට ද හඳුන්වා දුන් අතර, එය ලාභදායී මෙන්ම පෝෂ්‍යදායී ආහාරයක් වශයෙන් ප්‍රචලිත වූයේ දහඅට වන ශතවර්ෂයේදී ය. එසේ වුවද වර්තමානය වන විට අර්තාපල් ලෝකයේ ප්‍රධාන ආහාර භෝග අතරින් එකක් බවට පත්වී අවසානය.

අර්තාපල් (Artapal) යන වචනය "ආර්ඩ් ආපලෙන්" (Ardappalen) යන ලන්දේසි වචනයෙන් බිඳී ආවක් නිසා ශ්‍රී ලංකාවට අර්තාපල් හඳුන්වා දෙන ලද්දේ ලන්දේසින් විසින් යැයි අනුමාන කළ හැකිය. ("Ardappalen" යන ලන්දේසි වචනයේ තේරුම Earth Apple යන්නයි.) ශ්‍රීමත් සැමුවෙල් බේකර් වැනි යුරෝපීය වතු පාලකයන් විසින් එක්දහස් අටසිය පණස් ගණන් වල ගෙවතු වගාවක් ලෙස නුවරඑළියේ අර්තාපල් වගා කල බවට තොරතුරු ඇති නමුදු ප්‍රධාන ආහාර භෝගයක් ලෙස සලකමින්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අර්තාපල් සම්බන්ධයෙන් සංවිධානාත්මක ලෙස පර්යේෂණ ආරම්භ කලේ 1948 න් පසුව ය. එය ප්‍රධාන භෝගයක් ලෙස ගොවීන් අතර ව්‍යාප්ත වී ගියේ මෙරට පාරිභෝගිජනය සඳහා අර්තාපල් ආනයනය අත්හිටුවීමට 1967 මැයි මාසයේ දී රජය ගත් තීරණයෙන් පසුවය.

මූලික වශයෙන් කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ ආර්ථික භෝගයක් ලෙස අර්තාපල් වගාව පෙරමුණෙහි සිටී. වෙනත් භෝගයන් හා සසඳන විට බීජ සඳහා විශාල මුදලක් වැය කළ යුතු එලවළු භෝගයක් බවට පත් ව ඇති නමුදු අර්තාපල් නිෂ්පාදනය අතින් ශ්‍රී ලංකාව අද ස්වයංපෝෂිත භාවයට ලංවෙමින් සිටී.

මෙරට ගොවීන්ගෙන් 25,030 කට අධික පිරිසක් අර්තාපල් වගාවෙහි නියැලී සිටින බව සමීක්ෂණ වලින් පෙනේ. එසේම 1985 දී මෙරට අර්තාපල් සඳහා වූ සාමාන්‍ය ගොවිපල මිල ගණන් වලට අනුව (කිලෝ එකකට රු. 11.50) එම වසරේ දී නිෂ්පාදනය කරන ලද මුළු අර්තාපල් තොගයේ වටිනා කම රුපියල් දස ලක්ෂ 1356 ක් විය. මෙසා විශාල ධනයක් අපේ ජාතික නිෂ්පාදනයට එකතු කරන අර්තාපල් ශ්‍රී ලංකා වාසීන්ගේ ජනප්‍රිය ආහාරයකි.

අද ලෝ පුරා ව්‍යාප්ත වී ඇති ප්‍රධාන අර්තාපල් වර්ග දෙක වන්නේ පොදු අර්තාපල් (common Potato) සහ සුදු අර්තාපල් යන (white Potato) දෙවර්ගයයි. සමහර රටවල් සත්ව ආහාරයක් වශයෙන් භාවිතා කරනු ලැබුවත්, අර්තාපල් බොහෝ විට මනුෂ්‍ය ආහාරයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනේ. සමහර යුරෝපීය රටවල ප්‍රධාන ආහාරයක් වන සුදු අර්තාපල්වල ලෝක නිෂ්පාදනය ටොන්ඩර 80,003,003,000 ටත් වඩා වැඩිය. අපේ අර්තාපල් නිෂ්පාදනය මීන් දශම ගණනක් වුවත්, මෙරට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අර්තාපල් වගාව ප්‍රමුඛස්ථානයක සිටී.

මෙරට නිෂ්පාදිත අර්තාපල් වර්ග බොහෝ විට හඳුන්වනු ලබන්නේ ඒවා නිෂ්පාදනය වූ ප්‍රදේශයේ නමිනි. ප්‍රදේශය අනුව එම අර්තාපල් වල තත්ත්වයේ, රසෙහි, මිලෙහි මෙන්ම ඉල්ලුමෙහි ද, තරමක වෙනසක් දැකිය හැකිය. නුවරඑළිය අර්තාපල්, වැලිමඩ අර්තාපල් හා යාපනයේ අර්තාපල් වශයෙන් මේ වර්ග තුන බොහෝ විට හඳුන්වයි. මෙයින් වැඩි ඉල්ලුම ඇත්තේ මෙන්ම, තත්ත්වයෙන් හොඳ ඒවා යයි සලකනු ලබන්නේ ද, නුවරඑළිය වර්ගයේ අර්තාපල්ය.

ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන ප්‍රධාන අර්තාපල් වර්ග තුන ඉස්නා (Isna) ඩිසයිරි (Desiree) හා කෝඩිනාල් (cordinal) වේ. මේ අර්තාපල් වර්ග වල මාතෘ භූමිය, අයර්ලන්තය, ජර්මනිය වැනි යුරෝපා රටවල්ය. නුවරඑළිය ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් ඉස්නා වර්ගයේ අර්තාපල් වගා කරනු ලබන අතර, බදුල්ල දිස්ත්‍රික්කයේ වගා කරනු යේ ඩිසයිරිය. යාපනය දිස්ත්‍රික්කයේ මෙම වර්ග තුනම වගා කරනු ලබයි.

### ශ්‍රී ලංකාවේ අර්තාපල් වගාවේ ව්‍යාප්තිය

1948 න් පසු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය ඇතිව කරන ලද පර්යේෂණ වල ප්‍රතිඵලයක් වශයෙන් මෙරට අර්තාපල් වගා කරන ගොවීන් ප්‍රමාණයද, බිම් ප්‍රමාණය ද ක්‍රමයෙන් වැඩි වන්නට විය.

**ශ්‍රී ලංකාවේ අර්තාපල් වගාකල ඉඩම් ප්‍රමාණය, නිෂ්පාදනය හා හෙක්ටයාර් එකක් සඳහා ලැබුන සාමාන්‍ය ඵලදාව**

| වර්ෂය | වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර් | නිෂ්පාදනය මෙ.ටොන්. | හෙක්ටයාර් එකක් සඳහා නිෂ්පාදනය මෙ. ටොන් |
|---|---|---|---|
| 1967 | 1353 | 11531 | 8.52 |
| 1970 | 2770 | 32448 | 11.71 |
| 1973 | 2837 | 39586 | 13.95 |
| 1976 | 2798 | 38742 | 13.84 |
| 1979 | 4210 | 52454 | 12.45 |
| 1982 | 5700 | 65157 | 11.43 |
| 1983 | 6628 | 72000 | 10.86 |
| 1984 | 7909 | 98415 | 12.44 |
| *1985 | 8397 | 117973 | 14.04 |

*අපේක්ෂිත

මූලය : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ඉහත දැක්වෙන සංඛ්‍යා සටහන අනුව මෙරට අර්තාපල් වගාවට යට වූ බිම් ප්‍රමාණයෙහි වර්ෂයෙන් වර්ෂය වැඩිවීමක් සිදු වී ඇති බව පැහැදිලිය . 1967 දී හෙක්ටයාර් 1353 ක් වූ එම බිම් ප්‍රමාණය ක්‍රමයෙන් වර්ධනය වී 1985 වන විට හෙක්ටයාර් 8397 දක්වා වැඩිවී ඇත. එසේම දේශීය අර්තාපල් නිෂ්පාදනයේ ද වැඩිවීමක් මෙම සටහන මගින් පෙන්වනු ලබයි. 1967 දී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 11531 ක් වූ අතර, එය 1979 දී මෙට්‍රික් ටොන් 52,454 ක් වී 1985දී මෙට්‍රික් ටොන් ලක්ෂය ඉක්මවා ඇත. වගා කරන බිම් ප්‍රමාණය හා මුළු නිෂ්පාදිත ප්‍රමාණය වර්ධනය වීමෙන් මෙරට අර්තාපල් වගාව සම්බන්ධයෙන් අපට පැහැදිලි වන පළමු කරුණ වන්නේ විදේශයකින් අප කෘෂිකර්මාන්තයට එක් වූ අර්තාපල් වගාව අද වඩා ස්ථාවර තත්ත්වයකට වර්ධනය වී ඇති බවය.

හෙක්ටයාර් එකක් සඳහා අප ලත් අර්තාපල් අස්වැන්න ප්‍රමාණය 1967 දී මෙට්‍රික් ටොන් 8.52 ක්ව තිබී ක්‍රමයෙන් වැඩිවී 1973 දී මෙට්‍රික් ටොන් 13.95 ක් විය. එම වසරින් පසු මෙහි දැකිය හැක්කේ ක්‍රමික බැස්මකි. 1982 දී 11.43 ක් වූ එය 1983 දී 10.86 දක්වා පහල වැටී ඇත. මෙයින් පැහැදිලිවන කරුණ නම් වගා බිම් ප්‍රමාණය වැඩි වූ අනුපාතයට දේශීය නිෂ්පාදනය වැඩි නොවූ බවයි. නුසුදුසු ඉඩම් වගාව සඳහා යොදා ගැනීම හා වගාවට අවශ්‍ය අයුරින් සාත්තු සප්පායම් නොකිරීම වැනි හේතූන් මෙම පහල වැටීමට බලපාන්නට ඇත.

නමුත් එය නැවතත් 1984 දී ඉහළ ගියේය. 1985 දී එහි උපරිම නිෂ්පාදනය පෙන්විය. වර්තමානයේ අපේ අර්තාපල් වගාවෙන් (බිම් ප්‍රමාණයෙන්) උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට ගොවීන් උත්සාහ ගෙන ඇති බව මෙයින් පැහැදිලි ය.

මෙරට අර්තාපල් වගාව ව්‍යාප්ත වී ඇති ප්‍රදේශ මොනවාද යන්න හා එම ප්‍රදේශවල පමණක් එය ව්‍යාප්ත වූයේ ඇයිද යන්න සොයා බැලීම වැදගත් ය. ශ්‍රී ලංකාවේ මුලින්ම අර්තාපල් වගාව ආරම්භ කළේ නුවරඑළිය ප්‍රදේශයේ බව අප මුලින් සඳහන් කළෙමු. ක්‍රමයෙන් ව්‍යාප්ත වූ මෙම වගාව 1978 පමණ වන විට නුවරඑළිය දිස්ත්‍රික්කයේ පමණක් ඉඩම් අක්කර 2000 ත් 2500ත් අතර ප්‍රමාණයක් දක්වා වර්ධනය විය. ක්‍රමයෙන් බදුල්ල දිස්ත්‍රික්කය පුරා ද මෙම වැවිල්ල ව්‍යාප්ත විය. ඉන් අනතුරුව යාපනය ප්‍රදේශයේ අර්තාපල් සඳහා හිතකර දේශ ගුණයක් පවතින බව හඳුනා ගත් ගොවීහු යාපනයේ ද අර්තාපල් වැවූහ. අද ශ්‍රී ලංකාවේ වෙළඳපොලට අර්තාපල් සැපයීමේ ප්‍රමුඛස්ථානය ගෙන සිටින්නේ මෙම දිස්ත්‍රික්ක තුනයි.

අර්තාපල් වගාවේ ආරම්භක ප්‍රදේශය වන නුවරඑළිය අද දේශීය නිෂ්පාදනයට දායක වන්නේ 33% කින් පමණය. එහෙත් බදුල්ල දිස්ත්‍රික්කය 43% ක් මුළු නිෂ්පාදනයට එකතු කරමින් පෙරමුණට විත් ඇත. යාපනයේ නිෂ්පාදනය 24% කි. අනෙක් සියළුම ප්‍රදේශවල නිෂ්පාදනය දශම ගණනක් වනු ඇත. මෙම ප්‍රදේශ තුනෙන් අක්කරයකින් වැඩි පලදාවක් ලබා ගන්නේ යාපනයේ ගොවීන් වන අතර, අඩුම ඵලදාවක් ලැබෙන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවීන්ටය. යාපනයේ සූක්ෂම ක්‍රම මත ගොවිතැන් කරන ගොවියාට වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි වී ඇති අතර, වැලිමඩ ප්‍රදේශයේ අක්කරයකින් ලබා ගන්නා අස්වැන්න ප්‍රමාණය අඩුවීමට හේතු වී ඇත්තේ සාපේක්ෂ වාසි මත නියමිත කාලයට පෙර අස්වැන්න නෙලීම කරනු ලබන හෙයිනි.

නුවරඑළිය, බදුල්ල හා යාපනය යන මෙරට අර්තාපල් වැවෙන ප්‍රදේශ වල ඒ හා බැඳුන කන්න රටාවක් හඳුනා ගැනීමට අපට පුළුවන . අර්තාපල් වගාව බොහෝ විට වර්ෂාපතනය හා සම්බන්ධතාවයක් පවත්වනු ලබයි. වර්ෂය පුරාම අර්තාපල් වගාවට හිතකර දේශගුණ තත්ත්වයක් නුවර එළිය දිස්ත්‍රික්කයෙහි ඇත. නමුත් එහි ද අර්තාපල් වගා කරන පැහැදිලි කාල දෙකක් හඳුනා ගැනීමට අපට හැකිය. එනම් පෙබරවාරි මාර්තු කාලසීමාව හා අගෝස්තු සිට ඔක්තෝබර් මැද දක්වා කාල සීමාවයි. පෙබරවාරි හා මාර්තු වගාකල බීජ වල, අස්වැන්න ලබා ගන්නේ ජුනි හා ජුලි යන මාස වලය. එසේම අගෝස්තු හා සැප්තැම්බර් වගාකල බෝග වල අස්වැන්න දෙසැම්බර් හා ජනවාරි යන මාස වලදී ලබා ගනී. අවුරුද්දේ අනික් කාල වලදී ද සුළු වශයෙන් හෝ අර්තාපල් වගා කිරීම නුවරඑළිය දිස්ත්‍රික්කයේ දැකිය හැකිය. මෝසම් සුළං පවතින කාලවල දී සුළඟින් හානි පැමිණෙන නිසා සුළඟින් ආවරණය වූ ප්‍රදේශවල මෙසේ අවුරුද්ද පුරාම වගාව කල හැකිය. කෙසේ වුවත් නුවරඑළියෙහි වර්ෂය පුරාම පවතින මෙම හිතකර දේශගුණය, අර්තාපල් වල තත්ත්වය අතින් නුවරඑළිය අර්තාපල් අනික් දිස්ත්‍රික්ක වල ඒවා අභිබවා ඉදිරියට ගෙනවිත් ඇත.

බදුල්ල දිස්ත්‍රික්කයේ ද යල සහ මහ යන කන්න දෙක සඳහාම අර්තාපල් වගාකරනු ලබයි. මහ කන්නය සඳහා බීජ රෝපනය කරනු ලබන්නේ නොවැම්බර් දෙසැම්බර් හා ජනවාරි යන මාසවලදීය. මෙම වගා වන්හි අස්වැන්න පෙබරවාරි හා මාර්තු යන මාසවලදී ලබා ගනී. මහ කන්නය සඳහා බෝහෝ විට කඳු බෑවුම් වල මෙන්ම කුඹුරු වලද අර්තාපල් වගා කරනු ලැබුවත් මැයි ජුනි ජුලි යන මාස වල බීජ සිටුවීම කරනු ලබන යල් කන්නය සඳහා බොහෝ විට අර්තාපල් වගා කරනු ලබන්නේ කුඹුරු වල පමණි. සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාසවල දී ඒවායේ අස්වැන්න ලබා ගැනීමට හැකිවේ. බදුලු දිස්ත්‍රික්කයේ වැඩි ඉඩම් ප්‍රමාණයක අර්තාපල් වගා කරනු ලබන්නේ යල් කන්නය සඳහාය.

මුහුදු මට්ටමේ ඇති බිම්වල අර්තාපල් වගාව ව්‍යාප්ත ව ඇති එකම දිස්ත්‍රික්කය යාපනයයි. මෙහි අර්තාපල් වගා කරනු ලබන්නේ මහ කන්නය සඳහා පමණය. නොවැම්බර් හා දෙසැම්බර් යන මාසවල බීජ සිටවනු ලබන අර්තාපල් වෙළඳ පොලට ලැබෙන්නේ පෙබරවාරි හා මාර්තු යන මාසවලදීය. මේ හැරුනු විට පුත්තලම, මාතලේ, වව්නියාව, මන්නාරම මහනුවර යන දිස්ත්‍රික්ක වල මහ කන්නය සඳහා පමණක් ඉතා සුළු වශයෙන් අර්තාපල් වගා කරනු ලබයි. පුත්තලම හැරුනු විට අනෙක් දිස්ත්‍රික්ක වල එය නොසැලකිය යුතු තරම් ප්‍රමාණයක් වෙයි.

**අර්තාපල් නිෂ්පාදනයෙහිලා බලපාන ගැටළු**

මෙරට අර්තාපල් වගාව ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැමිණි බව ඉහත සඳහන් විය. ස්වයංපෝෂිත භාවයට ඉතාම ආසන්න මට්ටමක අද දේශීය අර්තාපල් නිෂ්පාදනය පවතින්නේ නිෂ්පාදනයෙහිලා බල පෑ බාධක රාශියක් මග හරිමිනි. ශ්‍රී ලංකාවේ අර්තාපල් වගාවෙහි ව්‍යාප්තියට හරස් වන ප්‍රධාන ගැටළු තුනක් හඳුනා ගැනීමට හැකිය. එනම් අර්තාපල් වගාව සඳහා අධික වියදම් දැරීමට සිදු වීම, (බීජ අර්තාපල් සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කිරීමට ගොවීන්ට සිදු වී ඇත.) අර්තාපල් බීජ ආයාත කරන නිසා කලට වේලාවට අවශ්‍ය තරම් බීජ ලබා ගැනීමට අපහසු කම් ඇතිවීම හා ඒ සඳහා සුදුසු ඉඩම් ප්‍රමාණය ක්‍රමයෙන් හීන වී යාම යන කරුණු තුනයි.

දේශීය අර්තාපල් නිෂ්පාදනය පසුපසට අදින ගැටළු කොතරම් බලවත් වුවත් අපේ අවශ්‍යතාවයෙන් 98% ක් ම නිපදවා ගැනීමට අප සමත් වී ඇති බව පහත සඳහන් සටහන පෙන්වා දෙයි.

**ශ්‍රී ලංකාවේ අර්තාපල් නිෂ්පාදනය ආයාත ප්‍රමාණය හා ආයාතවල වටිනාකම දක්වන සටහන**

| වර්ෂය | දේශීය නිෂ්පාදනය මෙ.ටොන් | ආයාත ප්‍රමාණය මෙ. ටොන් | ආයාතවල වටිනාකම රු. දශලක්ෂ | ආනයනය කල ප්‍රමාණය මුළු ප්‍රමාණයේ %ක් වශයෙන් |
|---|---|---|---|---|
| 1970 | 32448 | 187 | 0.2 | 0.6 |
| 1971 | 38300 | 3720 | 3.8 | 8.9 |
| 1972 | 46871 | 5942 | 7.6 | 11.2 |
| 1973 | 39586 | 1275 | 1.8 | 3.1 |
| 1974 | 30365 | 10027 | 5.5 | 24.8 |
| 1975 | 27301 | 587 | 1.1 | 2.14 |
| 1976 | 38742 | 870 | 2.2 | 2.2 |
| 1977 | 33413 | 141 | 0.6 | 0.4 |
| 1978 | 38412 | 3967 | 12.8 | 9.4 |
| 1979 | 52454 | 8290 | 35.0 | 13.6 |
| 1980 | 75874 | 11071 | 50.9 | 12.7 |
| 1981 | 63387 | 1000 | 2.6 | 1.6 |
| 1982 | 65157 | 7 | 0.007 | 0.01 |
| 1983 | 72000 | 861 | 5.7 | 1.1 |
| 1984 | 98415 | 3000 | 31.5 | 2.96 |
| *1985 | 117973 | 2450 | 25.7 | 2.03 |

*අපේක්ෂිත

මූලය : කෘෂිකර්ම අමාත්‍යාංශය

පාරිභෝජනය හා බීජ යන කරුණු දෙක සඳහාම ආනයනය කළ මුළු අර්තාපල් ප්‍රමාණයත් ඒ සඳහා වැයවූ විදේශ විනිමය ප්‍රමාණයත් එම සටහනින් පැහැදිලිය. මෙය වසරින් වසර වෙනස් වී ඇති බව පැහැදිලිය. ආනයනය කිරීමට සිදු වී ඇති නිසා අපට පැහැදිලි වන එකම කරුණ නම් දේශීය අවශ්‍යතා අපෙන්ම සපුරා ගැනීමට තවමත් නොහැකි වී ඇති බවයි. 1970 දී පමණ අඩු ප්‍රමාණයක පැවතුන ආයාත ප්‍රමාණය 1974 දී උපරිම මට්ටමකට පත් විය. නමුත් 1975, 1976, 1977 වර්ෂ වලදී මෙය සීඝ්‍රයෙන් පහල වැටුනි. 1977 දී මෙරට මුළු අවශ්‍යතාවයෙන් 0.4% කට වැඩි ප්‍රමාණයක් ආනයනය නොකල අතර, මූලික බීජ අවශ්‍යතාවයන් පමණක් ගෙන්වා ඇති බව පැහැදිලි ය. ඉන්පසුව වර්තමාන රජය ක්‍රියාත්මක කළ ලිහිල් ආනයන ප්‍රතිපත්තිය නිසා අර්තාපල් ආනයනය සීඝ්‍රයෙන් ඉහල නගින්නට විය. 1978 දී එය 9.4% දක්වාත්, 1979 දී දේශීය අවශ්‍යතාවයෙන් 13.6% දක්වාත් ඉහල නැංගේය. නමුත් රජය ඉන්පසුව අර්තාපල් වගාව ගැන වැඩි සැලකිල්ලක් දැක්වීමට වූ අතර, මෙරට අර්තාපල් වලින් ස්වයංපෝෂිත කිරීමට ගන්නා උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ආනයනය ප්‍රමාණය පහල වැටෙන්නට විය. 1981, 1982 යන වර්ෂවලදී පහල වැටුන මෙම ආනයන ප්‍රමාණය 1982 වර්ෂයේ දී මෙට්‍රික් ටොන් 7 දක්වා පහල වැටුනේ ය. මෙය මෙරට අර්තාපල් පිළිබඳ ඉතිහාසයේ වාර්තාගත සිද්ධියක් වනු ඇත. එම වර්ෂයේ දී අපගේ බීජ අවශ්‍යතාවයන්ගෙන් අප ආනයනය කර ඇත්තේ 0.05% ක් වැනි ප්‍රමාණයකි. නමුත් මෙම තත්ත්වය ඉන් මතුවට පවත්වාගෙන යාමට අපහසු විය. 1983 වර්ෂයේ දී ආනයන ප්‍රමාණය දේශීය අවශ්‍යතාවයෙන් 1.1% ක් විය. 1984 දී 3% ක් වූ එය 1985 දී නැවතත් 2% දක්වා පහල වැටුනි.

ආයාත පිළිබඳ සංඛ්‍යා ලේඛණ පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වන එකම කරුණ නම් දැනට ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයාට පාරිභෝජනය සඳහා, අර්තාපල් ආනයනය කිරීමක් අවශ්‍ය නොවන බවයි. අර්තාපල් ආනයනය කිරීමට සිදුව ඇත්තේ මූලික බීජ අවශ්‍යතාවයන් සඳහා පමණය. එබැවින් පාරිභෝජන අවශ්‍යතාවන්ගෙන් අප ස්වයංපෝෂිත යැයි සඳහන් කිරීම නිවැරදිය.

අපේ දේශීය නිපැයුම පාරිභෝජනය සඳහා ප්‍රමාණවත්ය. අර්තාපල් වවන්නෝ නුවරඑළිය බදුල්ල සහ යාපනය දිස්ත්‍රික්කයේ ගොවිහුය. පාරිභෝගිකයෝ ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වී ඇති මුළුමහත් ජනතාවමය. අපගේ මූලික ආමුන වන්නේ දිවයිනේ දිස්ත්‍රික්ක තුනක නිපදවන මුළු නිෂ්පාදනය රට පුරා බෙදා හරින අයුරු සොයා බැලීමය. මේ මහත් ක්‍රියාවලිය අලෙවිකරණය යනුවෙන් හැඳින්වීමට අප පුරුදු වී සිටිමු.

**අලෙවිකරණය**

අලෙවිකරණය යන්න වඩාත් පුළුල් අර්ථයක් සඳහා යෙදවිය හැක්කකි. නිෂ්පාදනයේ සිට පාරිභෝගිකයා දක්වාම එක් එක් පුද්ගලයන් මගින් සිදු වන ක්‍රියාවලින් සියල්ලම අලෙවිකරණය යන්නට අයත් වේ. නමුත් මෙහි දී අලෙවිකරණය යන්න එතරම් සංකීර්ණ නොවූ නිෂ්පාදනයෙන් පසු එම භාණ්ඩ අලෙවි කර ගැනීම යන සරල අදහස සඳහා යොදගෙන ඇත.

මෙහිදී අර්තාපල් වල අලෙවිකරණ රටාව සැකසී ඇත්තේ කෙසේ ද යන්න ගැන විග්‍රහ කිරීමට පළමු වෙන් උත්සාහ ගන්නා අතර, වෙළඳපොලේ මිළ තීරණය වන අයුරු, මිළ වෙනස් වීම් සිදුවන අයුරු හා ඒවාට බලපාන සාධක හැරුණුවිට අලෙවිකරණයේදී නිෂ්පාදකයාට වෙළෙන්දට සහ පාරිභෝගිකයාට මුහුණ දීමට සිදුවන ගැටළු මොනවාද යන්න ගැන යම් විග්‍රහයක් ඉදිරිපත් කිරීමට උත්සාහ ගත්තෙමු. අවසානයේ දී එම අවහිරතා මගහරවා ගන්නේ කෙසේද යන්න ගැන යම් විමසීමක් කිරීමට බලාපොරොත්තු වෙමි.

**අලෙවිකරණ රටාව**

මෙරට අර්තාපල් නිෂ්පාදකයා තම අස්වැන්න නෙලාගත් විගසම එය වෙළඳ පොළට එවීමට පුරුදු වී සිටී. අස්වැන්න නෙලීමෙන් පසු සිදුවන (සැපයුම ඉහළ යෑමෙන්) මිළ පහළ බැසීම අවසන් වන තුරු අලෙවි කිරීම පමා කිරීමේ ක්‍රමයක් මෙරට ගොවීන් අනුගමනය නොකරයි. යාපනය ප්‍රදේශයේ ගොවීන් තම අර්තාපල් බීජ වශයෙන් තබා ගැනීමේ පුරුද්දක් නොලත් බැවින් ඔවුන් එවේලේම තම මුළු නිෂ්පාදනයම වෙළෙඳපොලට එවයි. නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්කවල ගොවීන් තම නිෂ්පාදනයෙන් 15% ක් වැනි ප්‍රමාණයක් බීජ වශයෙන් තබා ගෙන ඉතිරිය වෙළඳ පොළ කරා යවයි.

අර්තාපල් සඳහා පවතින අලෙවි රටාව එළවළු අලෙවි කරණ රටාවට බොහෝ දුරට සමානය. මෙම අලෙවිකරණයේ ප්‍රධාන අංශ තුනක් අපට හඳුනා ගත හැකිය. එනම් පුද්ගලික හෝ සම්ප්‍රදයික අංශය, රාජ්‍ය අංශය හෝ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව හා සමුපකාර අංශය හෝ මාක්ෆෙඩ් (Markfed) අංශය වශයෙනි. මේ අංශ තුන මගින් ම අර්තාපල් එකතු කිරීම (නිෂ්පාදකයාගෙන්) තොග වෙළඳාම සහ සිල්ලර වෙළඳාම යන කරුණු තුනම කැරනු ලබයි. නමුත් අලෙවිකරණයේ දී 95% ක් පමණ සහභාගිත්වයක් දරනු ලබන්නේ මෙම පෞද්ගලික අංශය වශයෙන් හඳුන්වන සම්ප්‍රදයික කොටසයි.

මෙම පුද්ගලික අංශය මගින් කෙරෙන වෙළඳාමේදී එයට සම්මාදම් වන අතරමැදියන් රාශියකි. නිෂ්පාදකයා, ප්‍රවාහන නියෝජිතයා, කොළඹ කොමිස් අලෙවි නියෝජිතයා, නාගරික තොග වෙළෙන්ද, ප්‍රවාහනකරු (බොහෝ විට තොග වෙළෙන්දමය) ග්‍රාමීය සිල්ලර වෙළෙන්ද හා පාරිභෝගිකයා වශයෙන් මේ මාර්ගයෙහි සිටින තැනැත්තන් හඳුනාගත හැකිය. සමහරවිට මීට වඩා අතරමැදියන් සිටීමට හැකිවන අතර, කෙලින්ම නිෂ්පාදකයින්ගෙන් පාරිභෝගිකයාට යන අවස්ථා ද නැතැයි කිව නොහැකිය. අර්තාපල් නිෂ්පාදකයා ළඟට පැමිණෙන්නේ ප්‍රවාහණ නියෝජිතයාය. ඔහු කොළඹින් එන ලොරි සඳහා අර්තාපල් එකතු කරන පුද්ගලයා වෙයි. මොහු සමහරවිට කෙලින්ම ගොවියාට මිළදී නිෂ්පාදන ලබාගෙන සුළු ලාභයක් තබා ගෙන තොග වෙළෙන්දට විකුණනු ලබයි. එසේ නැතිනම් කොළඹින් එන තොග වෙළෙන්දා ගෙන් ලබා ගන්නා යම් දීමනාවක් මත මෙම කටයුත්ත කරනු ලබයි. ඔහුගෙන් ලබා ගන්නේ කොළඹ කොමිස් අලෙවි නියෝජිතයාය. ඔහු විසින් එම අර්තාපල් කොළඹ තොග වෙළඳ පොලේ එදිනෙද තීරණය වන මිළට අලෙවි කරනු ලබයි. නිෂ්පාදකයා ලබා ගන්නා මිළ බොහෝ විට තීරණය කරනු ලබන්නේ කොළඹ සිටින මේ තොග වෙළෙන්දය.

ඔහුට ලැබෙන මුදලින් ඔහු තම කොමිෂන් එක වශයෙන් රුපියල් සියයකට රුපියල් 5ක් ලබා ගයි. (දැනට ක්‍රියාත්මක වන ක්‍රමය) ඉන් පසුව ප්‍රවාහන වියදම් ප්‍රවාහන කරුවාට ගෙවනු ලැබේ. ප්‍රවාහනය සඳහා අර්තාපල් කිලෝ 1 කට වැලිමඩ සිට ගෙන එන විට ශත 35 ක් පමණ ද, නුවරඑළිය සිට ගෙන ඒමට ශත 40 ක් පමණ ද වැයවේ. නමුත් වර්තමානයේ යාපනය ප්‍රදේශ යේ කිලෝ 50 ක අර්තාපල් තොගයක් ගෙන ඒමට රුපියල් 50 ක් පමණ වැයවේ. එයට ප්‍රධාන හේතුව වන්නේ කලබලකාරි තත්ත්වය මගින් ඇති කර ඇති දැඩි අවදානම නිසා ප්‍රවාහන ගාස්තුව ඉහළ යාමය. මෙය හැරුණ විට අර්තාපල් කිලෝ 50 ක මිටියක් සඳහා බර ඉසිලීමේ කුලිය වශයෙන් රුපියල් 2 ක් ගෙවීමට සිදුවනු ඇත. මෙම නාටාභාමී කුලිය ද ගෙවිය යුත්තේ ගොවියා විසිනි. එම මුදල් වෙන් කල තොග වෙළෙන්ද ඉතිරිය ගොවියාට යවනු ලබයි.

මේ අනුව පසුගිය පෙබරවාරි (1986) මාසයේ දී කොළඹ පැවතුන සාමාන්‍ය තොගමිළ ගණන් අනුව (නුවරඑළිය කිලෝ 1 ට රුපියල් 16.17, වැලිමඩ කිලෝ 1 ට රුපියල් 14.88 සහ යාපනය කිලෝ 1 කට රුපියල් 10.85) එක් එක් ප්‍රදේශවල අර්තාපල් නිෂ්පාදකයා විසින් අර්තාපල් කිලෝ 100 ක් සඳහා ලබාගත් ආදයම පහත සටහනින් දක්වමු.

**අර්තාපල් කිලෝ 100 කින් නිෂ්පාදකයා ලබාගත් ආදායම**

(සංඛ්‍යා රුපියල් වලින්)

| දිස්ත්‍රික්කය | තොග වෙළෙන්ද ලබන මුදල | ප්‍රවාහන වියදම | නාටහාමි කුලී | කොමිස් මුදල | නිෂ්පාදකයාට ලැබෙන මුදල |
|---|---|---|---|---|---|
| නුවරඑළිය | 1617 | 40 | 4 | 81 | 1492 |
| බදුල්ල | 1488 | 35 | 4 | 74 | 1375 |
| යාපනය | 1085 | 100 | 4 | 54 | 927 |

+ කොමිස් මුදල 5% ය.

+ නාටහාමි කුලී කිලෝ 50 ක මිටියක් රු. 2 වශයෙන් සලකා ඇත.

කොළඹ තොග වෙළෙන්දගෙන් අර්තාපල් ලබා ගන්නේ නාගරික තොග වෙළෙන්දය. ඔහු කොළඹින් තොග වෙළෙන්දට මුදල් ගෙවා ලබා ගන්නා අර්තාපල් තමාගේ වෙළෙඳ පොළ වෙත ගෙන යයි. යම්කිසි ප්‍රමාණයක ලාභයක් තබාගෙන එය ග්‍රාමීය සිල්ලර වෙළෙන්දෙකුට විකුණයි. ප්‍රවාහන කරු යනු තොග වෙළෙන්දගෙන් තොග වශයෙන් ලබා ගෙන සිල්ලර වෙළඳසැල් වෙත ගෙන ගොස් විකුණනු ලබන පුද්ගලයන් ය. මොවුන් ද එසේ කරන්නේ යම් ලාභයක් සඳහාය. අවසානයේ භාණ්ඩය පාරිභෝගිකයාට විකුණනු ලබන්නේ ග්‍රාමීය සිල්ලර වෙළෙන්දය. පාරිභෝගිකයා භාණ්ඩය ලබා ගන්නා මිළ ග්‍රාමීය සිල්ලර වෙළෙන්ද ඒ සඳහා තීරණය කරනු ලබන මිළයි.

පහත සඳහන් සටහන මගින් කොළඹ අවට සිටින පාරිභෝගිකයා අර්තපාල් මිළ දී ගැනීමට කැප කල මුදල බෙදී ගිය අයුරු පැහැදිලි වේ.

**අර්තාපල්වල සිල්ලර මිළ හා ගොවිපල මිළ අතර වෙනස**

| වර්ගය | *පාරිභෝගිකයා ගත් මිළ | සිල්ලර වෙළෙන්දගේ ආදායම (ඔහුගේ වියදම් ද ඇතුළත්ය) | තොග වෙළෙන්ද ගෙවූ මිළ | කොමිස් ප්‍රවාහන හා නාටහාමි කුලී | නිෂ්පාදකයා ලබාගත් මුදල |
|---|---|---|---|---|---|
| නුවරඑළිය | 100 | 17.08 | 82.92 | 6.41 | 76.51 |
| වැලිමඩ | 100 | 15.79 | 84.21 | 6. 4 | 77.81 |
| යාපනය | 100 | 19.63 | 80.37 | 11.56 | 68.81 |

* සිල්ලර මිළ කිලෝ 1 ක් නුවරඑළිය වර්ගය රුපියල් 19.50, වැලිමඩ වර්ගය රුපියල් 17.67, යාපනය වර්ගය රුපියල් 13.[illegible]0 යන 1986 පෙබරවාරි මාසයේ පැවැති මිළ ගණන් අනුව සකස් කොට ඇත.

මෙම සටහන අනුව නුවරඑළිය සහ වැලිමඩ ප්‍රදේශවල ගොවීන් ලබා ගන්නා මිළෙහි එතරම් වෙනසක් නොමැති බව පැහැදිලි ය. නමුත් තමාගේ නිෂ්පාදනයේ වටිනාකමෙන් 31%ක් පමණ යාපනයේ ගොවියාට අහිමිවී යයි. වර්තමානයේ යාපනයේ පවතින කලබල කාරී තත්ත්වය නිසා නිතැතින්ම ඉහළ ගිය ප්‍රවාහන වියදම් විසින් මෙම තත්ත්වය ඇතිකර ඇත.

මෙහිදී වැඩි යම් අදහසක් වර්ෂ කීපයක සංඛ්‍යා ලේඛණ සසඳා බැලීමෙන් ලබාගත හැකිය. එහිදී ඒ ඒ අර්තාපල් වර්ග යන්හි මිළෙහි වෙනස නොසලකා හැර ඇති අතර අර්තාපල් සඳහා වෙළඳ පොළෙහි පොදුවේ තීරණය වූ සාමාන්‍ය වාර්ෂික මිළ සැලකිල්ලට ගෙන ඇත.

සිල්ලර මිළෙහි ප්‍රතිශතයක් ලෙස නිෂ්පාදන මිළ

| වර්ෂය | % ගණන | වර්ෂය | %ගණන |
|---|---|---|---|
| 1968 | 66 | 1975 | 57 |
| 1969 | 64 | 1976 | 68 |
| 1970 | 78 | 1977 | 46 |
| 1971 | 54 | 1978 | 72 |
| 1972 | 76 | 1979 | 63 |
| 1973 | 74 | 1980 | 72 |
| 1974 | 69 | | |

මූලය : කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශය

1968 සිට 1980 දක්වා වර්ෂ වල මෙම ප්‍රමාණය සැලකිල්ලට ගැනීමෙන් මෙය 46% (1977 දී) ත් 78% (1970 දී ) ත් අතර පිහිටන බව පැහැදිලිය. මෙහි සාමාන්‍ය ප්‍රමාණය 66%කි. වෙනත් අයුරකින් ප්‍රකාශ කරන්නේ නම් පාරිභෝගිකයා රු. 10 ක් ගෙවා මිළදී ගන්නා අර්තාපල් කිලෝ එකක් සඳහා නිෂ්පාදකයා ලබා ගන්නේ සාමාන්‍යයෙන් රු. 6.60 ක මිළකි.

නමුත් පළමු සටහන අනුව බලන විට වඩා ප්‍රතිශතයක් ගොවියා ලබා ගන්නා බව පෙනෙයි. දිවයිනේ තැනින්තැන පවතින සිල්ලර මිළ එකිනෙකට තරමක් වෙනස් ය. එසේම තොග වෙළෙන්දා හා සිල්ලර වෙළෙන්දන් අතර සිටින අතරමැදියන් සංඛ්‍යාව අනුව සිල්ලර මිළ ඉහල යාම සිදුවේ. කොළඹ අවට සිටින සිල්ලර වෙළෙඳුන් බොහෝවිට තමුන්ම තොග වෙළඳපොලට පැමිණ තොග රැගෙන යති. එම නිසා එහි දී අතරමැදියන් නොමැත. එවිට තොග මිළ සහ සිල්ලර මිළ අතර වෙනස අඩු කොට විකිණීමට සිල්ලර වෙළෙන්දට හැකිය. ඔහුට ඉන් අලෙවි වන ප්‍රමාණය වැඩිකර ගත හැකිවේ. නමුත් මෙම තත්ත්වය කොළඹින් පිට වෙළඳ පොල වලට යනවිට ක්‍රමයෙන් වෙනස් වන නිසා, සිල්ලර මිළ ඉහල යැමෙන් මෙහි තරමක වෙනසක් පිළිබිඹු වීමට ඉඩ ඇත.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ හා මාක්ෆෙඩ් වල නියෝජිතයන් ගොවීන්ගෙන් නිෂ්පාදන ලබා ගැනීමට උත්සාහ කරනු ලබයි. තම නියෝජිතයන් ගොවීන් වෙත යවා ඒවා එකතු කර ගැනීමට සමහර කාල වලදී දරණ උත්සාහයක් දැකිය හැකිය. බොහෝ විට දෙපාර්තමේන්තුවේ වෙළඳපොල කරා ගොවියා තම භාණ්ඩ ගෙනවිත් හැර දිය යුතුය. නමුත් පුද්ගලික වෙළෙන්දා වගා බිමටම විත් එම භාණ්ඩ මිලදී ගනී. ගොවියාට කිසි අපහසුතාවයකට පත්වීමට හේතුවක් නැත. කෙසේ වුවත් අර්තාපල් අලෙවිය සඳහා මෙම අංශයේ සහභාගිත්වය මද බව පමණක් කිව හැකිය.

අර්තාපල් වල නිෂ්පාදන මිළ මෙන්ම පාරිභෝගික මිළ (සිල්ලර මිළ) අතර 44%ක පමණ වෙනසක් ඇති කර ඇත්තේ අලෙවි කරණ රටාව තුළ නිරතුරුව භ්‍රමණය වන අතර මැදියන් විසිනි. මෙම ක්‍රමයේ ඇති ප්‍රධාන දුර්වලතාවය වන්නේ නිෂ්පාදකයාට තමාගේ නිෂ්පාදන සඳහා මිළක් තීරණය කිරීමට නොහැකි වීමය. ගොවියාට ගෙවන මිළ තීරණය කිරීමේ අයිතිය බොහෝ විට කොමිස්කරුවා මත රඳා පවතී. මුලින් මොවුන් දෙපිරිස අතර හැඳුණුම් කමක් පවා නොමැති අතර, පසුව සම්බන්ධතා වර්ධනය වූ අයුරු දැකිය හැකිය.

මේ සඳහා ගතහැකි පියවර වන්නේ රාජ්‍ය අංශයේ අලෙවි කරණ කටයුතු වඩාත් දියුණු කිරීමයි. ගොවියාට වඩාත් සාධාරණ මිළක් ලැබෙන අයුරින් අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අර්තාපල් තොග ලබාගත හැකිය. පෞද්ගලික අංශයත් සමග තරගකාරී තත්ත්වයක් ඇතිකර ගැනීමට අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හැකි නම් එම තරගයේ මහඟු ඵල නෙලා ගන්නෝ ගොවීන් හා පාරිභෝගිකයෝ වෙති. මේ සඳහා කළහැකි දෙය නිවැරදි සැලැස්මක් අනුව අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව, මාක්ෆෙඩ් වැනි ආයතන ගොවීන් වෙත ට වඩාත් සමීප වීමයි.

අර්තාපල් ඇසිරීම කරන්නේ බොහෝ විට ගෝනි වලය. ප්‍රවාහණය කරන්නේ ලොරිවලය. මේ සමග එළවළු වර්ගද ප්‍රවාහනය කරනු ලබයි. ගෝනි වල ඇසිරීමෙන් තැලීම, පොඩිවීම, අපතේ යෑම, අවලක්ෂණවීම, විෂබීජ ආසාදනයවීම වැනි දේවලට භාජනය විය හැකිය. නමුත් එය එළවළු වල තරම් සිදු නොවේ. කෙසේ වුවත් අර්තාපල් පෙට්ටි වල ඇසිරීමට පුරුදු වී නම් එයින් ලබා ගත හැකි සාපේක්ෂ වාසිය වැඩිවනු ඇත.

අස්වැන්න නෙලීමෙන් පසු එළවළු වල බර අඩුවීම සාමාන්‍යයෙන් සිදු වන දෙයකි. නමුත් මෙය ඉතාම අඩුවෙන් සිදුවන එළවළු වර්ග වන්නේ අර්තාපල් සහ ළූණුය. මේ හැරුණ විට අර්තාපල් වල තොග තත්ත්වයේ අපතේ යෑමද ඉතා අඩුය. හේතුව තොග පිටින් අලෙවි කිරීම වන අතර, එදිනෙද කොළඹට ලැබෙන තොග බොහොමයක් එදිනම අලෙවි කරන නිසා තොග තත්ත්වයේ දී නාස්තිය අඩුය. සිල්ලර තත්ත්වයේදී මෙය තරමක් වෙනස් වේ. හොඳ තත්ත්වයෙන් ප්‍රවාහනය නොකරයි නම් ප්‍රවාහනයේ දී සිදුවන හානි නිසා නාස්තිය 10%ක් පමණ සිදුවනු ඇත. නමුත් මෙය සූක්ෂම ලෙස කරයි නම් සිල්ලර තත්ත්වයේ දී වුව ද නාස්තිය 5%—6% දක්වා අඩු කර ගැනීමට හැකිය. අල වර්ගයන් අනුව මෙම නාස්තියේ වෙනසක් සිදු නොවේ.

අර්තාපල් ඇසිරීමේ දී වර්ගීකරණය කිරීමක් තවමත් ක්‍රියාත්මක වන්නේ ඉතාමත් මඳ වශයෙනි. දැනට නුවරඑළියේ මෙම ක්‍රමය ක්‍රියාත්මක වේ. මෙම ක්‍රමය වර්ධනය කිරීම වඩාත් යෝග්‍ය වනුයේ ඉන් සලසා ගතහැකි වාසි නිෂ්පාදකයාට මෙන්ම අලෙවිකරුවාට ද ලැබෙන නිසාය. මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් කල් තබා ගැනීමේ හැකියාව වැඩිවීම, අර්තාපල් වල දැකුම්කළු බව වැඩිවීම, තරඟකාරීත්වයට මුහුණ දීමේ හැකියාව තියුණුවීම, මිළදී ගැනීමේදී ද්‍රව්‍යය තේරීමේ කාලය ඉතුරුවීම හා රුචිය ඇතිවීම, ප්‍රවාහනයේ දී අපතේයාම අඩුවීම, මිළ කිරීමේ කාර්යක්ෂමතාවය වැඩිවීම යන වාසි ලබාගත හැකිය.

## මිළ

(වෙළඳපොලේ මිළ තීරණය වන අයුරු හා මිළ වෙනස් වීම් වලට බලපාන සාධක)

ආර්ථික විද්‍යානුකූල නිගමනය අනුව භාණ්ඩයක මිළ තීරණය වන්නේ එයට ඇති ඉල්ලුමේ හා සැපයුමේ සමතුලිත තත්ත්වය මතයි. අර්තාපල් වලට ද මෙම තත්ත්වය පොදුය. වෙළඳ පොලට අර්තාපල් වැඩි වශයෙන් ලැබෙන කාලයේ අඩු මිළක් තීරණය වන අතර, අර්තාපල් අඩුවෙන් ලැබෙන කාලයේ වැඩි මිළක් තීරණය කරනු ලබයි.

## අර්තාපල්වල සාමාන්‍ය මිල දර්ශකය

(1981—1985 දක්වා සිල්ලර මිල ගණන් අනුව සාදන ලදී)

(සාමාන්‍ය මිල දර්ශකය 100 වශයෙන් සලකා ඇත.)

| මාසය | ජන. | පෙබ. | මාර්තු | අප්‍රේල් | මැයි | ජුනි |
|---|---|---|---|---|---|---|
| දර්ශකය | 107.20 | 88.40 | 83.35 | 111.27 | 108.39 | 106.06 |
| මාසය | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
| දර්ශකය | 118.52 | 108. 26 | 88.48 | 78.39 | 92.96 | 108.67 |

මෙම දර්ශකයට අනුව ඉහළම සංඛ්‍යාවක් පෙන්වන මාසය අර්තාපල් මිල ඉහළම මට්ටමක පවතින මාසයයි. ඒ අනුව ජූලි මාසයේ දී අර්තාපල් සඳහා වෙළඳ පොළේ ඉහළම මිළක් තීරණය වන අතර ඔක්තෝබර් මාසයේ දී අඩුම මිළක් තීරණය වෙයි.

අර්තාපල්වල මිළ පහළ වැටෙන පැහැදිළි කාලසීමාවන් දෙකක් මෙම දර්ශකය අනුව හඳුනා ගැනීමට හැකිය. මහ කන්නයේ අස්වැන්න වෙළඳපොලට ලඟා වන පෙබරවාරි හා මාර්තු යන මාස දෙකත්, යල් කන්නයේ අස්වැන්න වෙළඳපොලට ලැබෙන සැප්තැම්බර්, ඔක්තෝබර් සහ නොවැම්බර් යන මාස තුනක කාලයත්ය. බදුල්ල, නුවරඑළිය සහ යාපනය යන දිස්ත්‍රික්ක තුනේම නිෂ්පාදන පෙබරවාරි හා මාර්තු යන මාස වලදී වෙළඳපොලට ලැබෙන නිසා එම කාලයේ දී අර්තාපල් මිළ පහල වැටේ. නමුත් යල් කන්නයේ දී බොහෝ විට අර්තාපල් ලැබෙනුයේ බදුල්ල දිස්ත්‍රික්කයෙන් පමණි. නුවරඑළියෙන් ද සැහෙන ප්‍රමාණයක් ලැබෙන නමුත් වාර්ෂික නිෂ්පාදනයෙන් 28% ක් පමණ මේ කාලයේදී බදුල්ල දිස්ත්‍රික්කයෙන් පමණක් වෙළඳපොලට ලැබේ. මෙම වැඩි සැපයුම හා වැලිමඩ අර්තාපල් බොහෝ විට හොඳින් නොමේරූ තත්ත්වයක පවතින නිසා ඇතිවන කල් තබා ගැනීමේ අපහසුතාවය හේතුවෙන් මිළ පහල වැටේ

අර්තාපල් සඳහා ඉහළ මිළක් පවතින්නේ අර්තාපල් අවාරයේ දීය. විශේෂයෙන්ම අප්‍රේල්, මැයි, ජූනි, ජූලි හා දෙසැම්බර්, ජනවාරි යන කාලසීමාවන්හිදීය. මෙම කාලයේදී ප්‍රධාන නිෂ්පාදිත දිස්ත්‍රික්ක වලින් වෙළඳ පොලට ලැබෙන ප්‍රමාණය බෙහෙවින් අඩුවන අතර, යම් තරමක් හෝ ලැබෙනුයේ නුවරඑළිය ප්‍රදේශයෙන් වනු ඇත. මේ අනුව තොග වෙළඳ පොලට අර්තාපල් ලැබෙන කාලසීමාවන් හා සිල්ලර මිළෙහි හැසිරීම අතර, සැහෙන සම්බන්ධතාවයක් හඳුනා ගැනීමට අපට හැකිවනු ඇත.

අර්තාපල් මිළෙහි වාර්ෂික වැඩිවීමක් පවතින්නේ ද යන්න ගැන පැහැදිළි අවබෝධයක් ලබාගැනීමට පහත සඳහන් ලේඛණයෙන් පුළුවන.

### වර්ෂ කිහිපයක් තුළ දී ශ්‍රී ලංකාවේ අර්තාපල් සඳහා පැවති සාමාන්‍ය මිළ ගණන්

| වර්ෂය | සාමාන්‍ය තොග මිළ (කිලෝ 50 ට රු.) | සාමාන්‍ය සිල්ලර මිළ (කිලෝ 1 කට රු.) |
|---|---|---|
| 1982 | 422.00 | 9.32 |
| 1983 | 479.80 | 11.82 |
| 1984 | 631.57 | 15.29 |
| 1985 | 637.50 | 15.52 |

*මූලය : ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

මේ අනුව අර්තාපල් මිළෙහි වාර්ෂික වැඩිවීමක් පවතින බව පැහැදිලිය. 1982 දී රු. 422 ක් වූ තොග මිළ 1985 වන විට රු. 637.50 දක්වා ඉහළ ගියේය. වර්ෂ 4 ක් තුළදී තොග මිළෙහි වැඩිවීමේ වේගය 51% කි. සිල්ලර මිළ සලකා බලන විට 1982 දී කිලෝ 1 ක් රු. 9.32 ක් වූ අර්තාපල් මිළෙහි වැඩිවීම 1985 වන විට 67% කි. මෙසේ මිළ ඉහළ යාමට බලපෑ හේතු කිහිපයක් හඳුනා ගැනීමට හැකිය.

ජනගහණයේ වර්ධනයත් සමග අර්තාපල් සඳහා පවතින ඉල්ලුම වැඩිවීම ද මිළෙහි වැඩිවන උපනතියට එක් හේතුවක් විය. උද්ධමනය ද පසුගිය වර්ෂ වලදී මෙයට යම් බල පෑමක් කර ඇතැයි කීවොත් එය නිවැරදිය. වගාව සඳහා යොද ගන්නා ඉඩම්, ශ්‍රමය, බීජ වර්ග, කෘෂි රසායන ද්‍රව්‍ය, පොහොර ආදී යෙදවුම් වල මිළ ඉහළ යාමත් සමග ඇති වන නිෂ් පාදන වියදම් ඉහළ යාමද මිළ වැඩිවීමට හේතුවක් වන්නට ඇත. අලෙවි කටයුතු හා සේවාවන් ගේ වියදම කාලයත් සමග වැඩි වීම නිසාද අර්තාපල්වල මිළ ඉහළ යාම සිදුවේ. ඉන්ධන, වාහන හා ඒවායේ අමතර කොටස්වල මිළත්, සේවක වැටුප් ආදියත් ඉහළ යාම නිසා ප්‍රවාහන ගාස්තු අධික ලෙස ඉහළ යාම ද මෙම මිළ ඉහළ යාම කෙරෙහි බලපානු ලැබේ.

සූරවීර සහ අගලවත්ත යන දෙදෙනා 1983 දී කරන ලද සමීක්ෂණයේදී අර්තාපල් වල ආදායම් නම්‍යතාවය සහ මිළ නම්‍යතාවය ගණනය කොට ඇත. එම සටහනට අනුව අර්තාපල්වල ආදායම් නම්‍යතාවය 2 ක් වන අතර මිළ නම්‍යතාවය 1.2 කි. මිළ නම්‍යතාවය 1.2 නිසා අර්තාපල් සඳහා නම්‍ය ඉල්ලුමක් පවතින බව අපට පැහැදිලි වේ. එනම් මිළ වෙනස් වන ස්වභාවය අනුව ඉල්ලුමෙහි යම් තරමක වෙනස් වීමක් සිදුවන බවයි.

අර්තාපල්වල ආදායම් නම්‍යතාවය 2 වශයෙන් කීමෙන් පැහැදිලි වන්නේ පාරිභෝගික යාගේ ආදායම 10% ක ප්‍රමාණය කින් වැඩි වුවහොත් ඔවුන්ගේ අර්තාපල් සඳහා ඇති ඉල්ලුම 20% කින් ඉහළ යන බවකි. මිළ නම්‍යතාවයෙන් පැහැදිලි වන දෙය නම් මිළ 10%කින් පහළ වැටුනහොත් ඒ සඳහා ඇති ඉල්ලුම 12% කින් ඉහළ නගින බවයි. මෙයින් පැහැදිලි වන්නේ පුද්ගලයාගේ ආදායම සහ අර්තාපල් වල පවතින මිළ පාරිභෝගිකයාගේ ඉල්ලුම තීරණය කිරීම කෙරෙහි දයක වී ඇති බවයි,

අර්තාපල්වල තොග මිළ හා සිල්ලර මිළ අතර ඇති වෙනස අපට හඳුනා ගත හැකිය.

**1984 වර්ෂයේදී ඒ ඒ මාසය සඳහා කොළඹ තොග වෙළඳ පොලේ සහ සිල්ලර වෙළඳපොලවල අර්තාපල් සඳහා පැවැති මිළ ගණන්** (කිලෝ 1 ට රුපියල්)

| මාසය | ජන : | පෙබ: | මාර්තු | අප්‍රෙ. | මැයි | ජූනි |
|---|---|---|---|---|---|---|
| තොග වෙළඳපොල | 10.71 | 11.32 | 12.09 | 11.48 | 11.96 | 11.80 |
| සිල්ලර වෙළඳපොල | 13.94 | 14.11 | 15.33 | 14.96 | 14.38 | 14.64 |
| තොග හා සිල්ලර මිළ අතර වෙනස | 3.23 | 2.79 | 3.24 | 3.48 | 2.42 | 2.84 |
| මාසය | ජුලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
| තොග වෙළඳපොල | 14.25 | 18.10 | 16.18 | 10.79 | 10.11 | 12.76 |
| සිල්ලර වෙළඳපොල | 16.07 | 20.82 | 18.43 | 13.56 | 12.31 | 15.03 |
| තොග හා සිල්ලර මිළ අතර වෙනස | 1.82 | 2.72 | 2.25 | 2.77 | 2.20 | 2.27 |

මූලය : ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

මෙම සටහන අනුව වර්ෂයේ මුල් කාර්තුවේ දී මෙම වෙනස (සිල්ලර මිළ සහ තොග මිළ අතර) වැඩි බව පැහැදිළිය. එය අඩුම වන්නේ ජූලි මාසයේ දීය. එනම් අර්තාපල් වැඩි වශයෙන් වෙළඳ පොලට ලැබෙන කාලයේ මෙම වෙනස ඉහළ මට්ටමක පවතිනු ඇත. අර්තාපල් සැපයුම අඩු වී මිළ ඉහළ නගින කාලයේ සිල්ලර වෙළෙන්ද ලබා ගන්නා ලාභය අඩුය.

මෙය මෙසේ සිදු වීමට හේතුව අර්තාපල් වල මිළ නම්‍යතාවය අනුව විග්‍රහ කිරීමට හැකිය. නම්‍ය ඉල්ලුමක් පවතින නිසා අර්තාපල් වල මිළ ඉහළ යන විට ඊට වඩා වැඩි වේගයකින් ඒ සඳහා ඇති පාරිභෝගික ඉල්ලුම පහත වැටෙනු ඇත. ඉල්ලුම පහත වැටෙන විට සිල්ලර වෙළෙන්දාට වැඩි ප්‍රමාණයක් විකුණා ගැනීමට නොහැකිය. එවිට ඔහු තම ඉල්ලුම වැඩි කර ගැනීමට කළ හැකි එකම දෙය වශයෙන් මිළ අඩු කිරීමට උත්සාහ ගනියි. සිල්ලර වෙළෙන්දාට මෙහිදී ගතහැකි විකල්ප දෙකකි. වැඩි මිළට සුළු ප්‍රමාණයක් විකුණනවාද? එසේ නැතිනම් අඩු මිළට වැඩි ප්‍රමාණයක් විකුණා තම ලාභය උපරිම කර ගන්නවාද? යන්නයි. සාමාන්‍යයෙන් සිල්ලර වෙළෙන්ද මෙහිදී තෝරා ගනු ලබන්නේ අඩු ලාභයක් තබාගෙන වැඩි භාණ්ඩ ප්‍රමාණයක් විකුණා තම ලාභය උපරිම කර ගැනීමයි. අර්තාපල් සැපයුම අඩු කාලයේ සිල්ලර වෙළෙන්ද ලබා ගන්නා ලාභය අඩු වන්නේ එම නිසායි. එසේම අර්තාපල් වැඩි සැපයුමක් තිබෙන කාලයේ මිළ පහළ වැටෙන නිසා, ඉල්ලුම සීඝ්‍රයෙන් ඉහළ නගියි. එවිට සිල්ලර වෙළෙන්ද වැඩි ලාභයක් තබා ගැනීමට උත්සාහ ගන්නා බව, සැපයුම වැඩි කාලයේදී තොග සහ සිල්ලර මිළ අතර වෙනස වැඩි වීමෙන් පැහැදිලි ය.

**අලෙවිකරණයේදී ඇති වූ ගැටළු සහ පිළියම්:**

අර්තාපල් වල අලෙවිකරණ රටාව සැකසී ඇති අයුරු අපි විමසා බැලුවෙමු. ඒ අනුව ඒ හා බැඳුණු ගැටළු කීපයක් අපට හඳුනා ගත හැකි විය. ඒවා නම් අලෙවි ක්‍රමය සකස් වී ඇති අයුරින් ගොවියාට (නිෂ්පාදකයාට) ලැබෙන මුදල ප්‍රමාණවත් නොවීම, මිළ ස්ථායිතාවයක් නොමැති වීම, අපතේ යෑම වැඩිවීම හා ඉහළ අලෙවි වියදමක් දැරීමට සිදුවීම ආදියයි.

අර්තාපල් අලෙවියෙන් 95%ක් පමණ සිදු වන්නේ පුද්ගලික අංශයෙන් බව ඉහත දී කීවෙමු. ඒ ඒ වර්ග වල අර්තාපල්වලට ලැබෙන සිල්ලර මිළෙන් ගොවියා ලබා ගන්නා ප්‍රතිශත ප්‍රමාණයද ඉහත දී පෙන්වා දුන්නෙමු. එයින් අපට පැහැදිලි වුනේ ගොවියාට ප්‍රමාණවත් මිළක් නොලැබෙන බවයි. මෙයට ප්‍රධාන හේතුව වන්නේ මෙම ක්‍රමය තුළ අතරමැදියන් රාශියක් බිහිවී සිටින අතර, ඒ ආශ්‍රයෙන් අලෙවි වියදම් අධික වීමයි. මෙයට කළ හැකි එකම පිළියම රාජ්‍ය අංශය දියුණු කිරීම පමණය. රාජ්‍ය අංශයෙන් අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් හෝ මාක්ෆෙඩ් වැනි ආයතන මගින් ගොවියා ළඟට ගොස් ගොවියාට සාධාරණ මිළක් ගෙවා අර්තාපල් ලබා ගන්නේ නම් පුද්ගලික වෙළෙන්දට අඩු මිළකට නිෂ්පාදන ලබා ගැනීමට නොහැකි වනු ඇත. ඇත්තෙන්ම සිදු විය යුත්තේ රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය අතර තරඟකාරී ස්වභාවයකි. මෙම තත්ත්වය තවමත් මෙරටෙහි සිදු වී නොමැත. පුද්ගලික අංශය ඉදිරියෙන් සිටින අතර, රාජ්‍ය අංශය පසුපසින් ඇදෙන අයුරක් පැහැදිලිය. මේ දෙකොටස අතර පූර්ණ තරඟයක් ඇතිවූ විට එකිනෙකා අලෙවිකරණයේ වැඩි කොටසකට හිමිකම් කීමට උත්සාහ කරයි. එසේ කළහැකි වන්නේ නිෂ්පාදකයාට හොඳ මිළක් ලබාදීමට කටයුතු කිරීමෙන් මෙන්ම පාරිභෝගිකයාට යම් සාධාරණ මිළකට භාණ්ඩ සපයා දීමට හැකි වීමෙන් ය.

මිළ දිනෙන් දින කාලයෙන් කාලය වෙනස් වීමෙන් පැහැදිලි වන්නේ අර්තාපල් සඳහා වෙළඳ පොලෙහි මිළ ස්ථායිතාවයක් නොමැති බවයි. නිෂ්පාදන කාලසීමාවේදී මිළ බෙහෙවින් පහත වැටෙන අතර, එමනිසා නිෂ්පාදකයා ලබා ගන්නා ආදයම් අඩු වෙනු ඇත. අවාරයේ දී පාරිභෝගිකයාට වැඩි මිළක් ගෙවා අර්තාපල් ලබා ගැනීමට සිදුවනු ඇත. අර්තාපල් වල මිළ

ගණන් වසරින් වසරත්, මාසයෙන් මාසයටත්, වෙනස් වෙන බව ඉහත සඳහන් සංඛ්‍යා සටහන් පිළිබිඹු කරයි. මේ සඳහා යෙදිය හැකි පිළියම වන්නේ අර්තාපල් ගබඩා කර තැබීමේ පහසුකම් ඇති කිරීම විනා වෙන කිසිවක් නොවේ. ගබඩා පහසුකම් ඇති කිරීම මගින් අධි නිෂ්පාදනයක් පවතින කාලයේදී සාධාරණ මිළක් ගොවියාට ගෙවමින් මිළදී ගන්නා අර්තාපල් සුරැකිව ගබඩා කොට තබා අවාරයේ දී වෙළඳපොලට නිකුත් කොට මිළ කෙරෙහි යම් බලපෑමක් කළ හැකිය. එසේ නොහැකි නම් ආයාත මගින් මෙම තත්ත්වය වෙනස් කළ හැකිය. හිඟ කාලයේ දී ඇති වන ඉල්ලුම සපුරාලීම ආයාත මගින් කළ හැකි නම් මිළ පහත වැටෙනු ඇත. නමුත් එහිදී සැලකිල්ල යොමු කළයුතු වන්නේ ආහාර ද්‍රව්‍යයක් ආයාත කිරීම දීර්ඝ කාලීනව කරගෙන යාම වඩාත් සුදුසු ද යන්න කෙරෙහි ය. එමනිසා කළ හැකි එකම පිළියම වන්නේ දූන් වියලි මිරිස් වලට කෙරීගෙන යනවාක් මෙන් ගබඩා පහසුකම් ඇති කොට එක් රැස්කර තැබීමයි.

අපතේ යෑම් හා ඉහළ අලෙවි වියදම් අනෙක් ගැටළුවයි. අලෙවි වියදම් ඉහළ යෑම සිදුව ඇත්තේ අතරමැදියන් වැඩි සංඛ්‍යාවක් සම්බන්ධවීම නිසාත්, ප්‍රවාහන වියදම්, සැකසීමේ වියදම් ආදිය වැඩිවීම නිසාත් ය. මේ සඳහා කළ හැක්කේ අලෙවිකරණය යම් සැලසුමකට සකස් කරමින් වියදම් අවම වන ලෙසින් කටයුතු කිරීමට උත්සාහ ගැනීමයි. මේ සඳහා ද පෞද්ගලික අංශයට වඩා යුහුසුළු විය යුත්තේ රාජ්‍ය අංශයයි.

අර්තාපල් වල සිදුවන අපතේ යෑම අනෙක් එළවළු වලට සාපේක්ෂව බෙහෙවින් ම අඩුය. නමුත් හොඳ ඇසුරුම් ක්‍රමයක් ඇත්නම් (පෙට්ටි වැනි ) එයද තවදුරටත් අඩුකර ගැනීමට හැකිය. මේ හැරුණු විට අස්වැන්න නෙලීමෙන් පසු සිදුවන අපතේ යෑම් අඩු කිරීමට නම් සරළ ගබඩා තාක්ෂණයක් දියුණු කළ යුතුය. තවද අස්වැන්න නෙලීමෙන් පසු සිදුවන අපතේ යෑම් පිළිබඳව මිණුම් දඬු යටතේ අවම මිළ ගණන් හා එවැනි නරක් වෙන සුළු ආහාර ද්‍රව්‍ය රාජ්‍ය අංශයේ ආයතන විසින් මිලදී ගැනීමේ ක්‍රමෝපායක් ගැන සලකා බැලීම වඩාත් යෝග්‍ය වනු ඇත.